# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2268/90 - 2022 පෙබරවාරි මස 25 වැනි සිකුරාදා - 2022.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (X) (ඒ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, දිනේෂ් ගුණවර්ධන වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 17745 දරන සමාගමක් වන සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වන වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2021 පෙබරවාරි මස 08 වැනි දින අංක 2214/4 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන "යාන්ත්‍ර විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව" යන සටහනට සහ එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන් යටතේ නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට අදාළ උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (එස්එල්කිවුඑෆ් 8 වන මට්ටම) සඳහා -

(*අ*) (i) අදාළ විෂයය ක්ෂේත්‍රයේ අධ්‍යයන සම්භාර 30ක් ඇතුළත්; හෝ

(ii) අදාළ විෂයය ක්ෂේත්‍රයේ අධ්‍යයන සම්භාර 30කට සමාන පූර්ව අධ්‍යයන හෝ සේවා පළපුරුද්ද සහිත,

ප්‍රථම උපාධියක් ලබා තිබීම; හෝ


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(*ආ*) (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති සුදුසුකමට සමාන අදාළ විෂයය ක්ෂේත්‍රයේ වෙනත් යම් සුදුසුකමක් සහිත වීම; හෝ

(*ඇ*) නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (එන්වීකිවු) 7 වන මට්ටමට සමාන පාඨමාලාවක් හදාරා තිබීම;

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබිය යුතු ය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | පීජීඩිප් (කළමනාකරණය) |

**දිනේෂ් ගුණවර්ධන,**
අධ්‍යාපන අමාත්‍ය.

2022 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ දී ය.

EOG 02 - 0662

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.